**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-11-04 |

පැමිණිලි පාර්ශවය : ජී.ජ්. ශ්‍යාමලී මිය,
310/26, කහතුඩුව දකුණ,
පොල්ගස්ඕවිට.

පැමිණිලි පාර්ශවය : 01 ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
කොළඹ 10.

02 අධ්‍යක්ෂ,
පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ.

03 අධ්‍යක්ෂ,
ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
කළුතර.

<u>පැමිණිලි අංකය : **HRC/3115/17**</u>

**පැමිණිල්ලේ කරුණු සැළ කිරීම :-**

2017-10-04 දාතමින් උක්ත නම් දරණ පැමිණිලිකාර පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, 2017 වර්ෂයේ පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලැබූ මුඛහනුක ශල්‍ය වෛද්‍ය පාඨමාලාව සඳහා තෝරා ගැනීමේ විභාගයට අදාළ අයදුම්පත නියමිත දිනදී තමා විසින් යොමු කළ නමුත් අදාළ




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் : sechrcsl@gmail.com

වගඋත්තරකරුවන්ගේ ප්‍රමාදය හේතුවෙන් විභාගයට පෙනී සිටීමේ හැකියාව ගිලිහී ගිය බවත්, මේ නිසා තමාගේ මූලික අයිතිවාසිකම් කඩවූ බවත්ය. ඒ අනුව මේ සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් :-**

**අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ වෛද්‍ය එන්.ඩබ්. අබේසිරිවර්ධන මහතාගේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළ වැඩිදුර විමර්ශනයේදී ඉහත වගඋත්තරකරු විසින් (2018-01-05 දින පැවති පරීක්ෂණයේදී) ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරිය වන වෛද්‍ය ශ්‍යාමලී මිය විසින් ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා යොමුකර ඇති අයදුම්පත තමන් වෙත 2017-08-09 දින ලැබී තිබූ බවත්, පසුව තමා එය නිර්දේශ කර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නියමිත පරිදි යොමු කර ඇති බවත්, ඒ අනුව තමා මෙහිදී පැමිණිලිකාරියට අගතියක් සිදුවන ආකාරයෙන් කටයුතු කර නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

**අධ්‍යක්ෂ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ කරුණු දැක්වීම :-**

2018-01-05 දිනැති පරීක්ෂණය සඳහා කොමිෂන් සභාවේ කැඳවීම පරිදි පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවෙන් ඉහත පරීක්ෂණයට සහභාගී වී ඇති එහි නියෝජ්‍ය ලේඛකාධිකාරී විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරිය වන වෛද්‍ය ශ්‍යාමලී මිය විසින් අදාළ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රය අදාළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර හෝ විභාගය පැවති දිනට පෙර නියමිත පරිදි තම ආයතනය වෙත නොලැබුණු බැවින් පැමිණිලිකාරිය වෙත එම විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දීමට හැකියාවක් පවත්නා නීති රීති අනුව නොවූ බවයි. ඒ අනුව තම ආයතනය මෙහිදී පැමිණිලිකාරියට අගතියක් සිදුවන ආකාරයෙන් කටයුතු කර නොමැති බවත් අනවශ්‍ය ප්‍රමාදයක් තම ආයතනය වෙතින් මෙහිදී සිදුව නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

**ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලේ කරුණු සම්බන්ධයෙන් ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, වෛද්‍ය ශ්‍යාමලී මියගේ අයදුම්පත ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා විසින් 2017-08-04 දිනැති ලිපිය මගින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

ජනරාල්වරයා වෙත යොමු කර ඇති බවත්, 2017-08-16 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ තෘතීයික සත්කාර සේවා අංශය වෙත අදාල අයදුම් පත්‍රය ලැබී ඇති බවට දින මුද්‍රාව අනුව පෙනී ගොස් ඇති බවත්, පසුව අදාල අයදුම්පත 2017-08-31 දින අධ්‍යක්ෂ (පාලන) වෛද්‍ය සේවා I ශාඛාව වෙත යොමු කර ඇති බවත් සඳහන් කර ඇත. 2017-09-08 දින අදාල විෂය නිලධාරිණිය විසින් මාණ්ඩලික සහකාර අධ්‍යක්ෂ (පාලන) වෛද්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනට යොමු කර ඇති බවත්, ඉන් පසුව 2017-08-31 දින සිට 2017-09-08 දින දක්වා කාලය තුල 2017-09-01, 02, 03 සහ 05 යන දිනයන් රජයේ නිවාඩු දිනයන් ලෙස ප්‍රකාශයට පත්වී තිබූ බැවින් 2017-09-04 විෂය නිලධාරිනියට අදාල අයදුම්පත ලැබී ඇති බවත්, එදින සිට වැඩ කරන දින 03 ක් තුල එම නිලධාරිනිය අයදුම්පත්‍රය අත්සනට යොමු කර ඇති බවත් සඳහන් කර ඇත.

පසුව තමා විසින් 2017-09-08 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් දත්ත සේවා වෙත අයදුම්පත යොමු කල බවත්, 2017-09-13 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අත්සන් යෙදූ අයදුම්පත්‍රය වෛද්‍ය සේවා ආයතනය වෙත ලැබී ඇති බවත්, 2017-09-14 දින අයදුම් පත්‍රය තැපැල් අංශය වෙත යොමු කර ඇති බවත් දක්වා ඇත.

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අදාල පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් කෙරෙහි අවධානය යොමු කිරීමේදී,

- පැමිණිලිකාරිය වන වෛද්‍ය ශ්‍යාමලී මිය විසින් ඉදිරිපත් කර ඇති අදාල පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා වන අයදුම් පත්‍රය ජාතික සෞඛ්‍ය විද්‍යාතනයේ අධ්‍යක්ෂවරයා විසින් 2017-08-04 දින නිර්දේශ කර 2017-08-04 දින ලියාපදිංචි තැපැල් මගින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කර ඇති බවත්,

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ තැපැල් අංශය විසින් එම අයදුම් පත්‍රය තෘතයික සේවා අංශය වෙත 2017-08-16 දින යොමු කර ඇති බවත්,

- අදාල විභාගය 2017-09-07 දින පවත්වා ඇති අතර, වගඋත්තරකාර පාර්ශවයේ ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනට එම අයදුම්පත යොමු කර ඇත්තේ 2017-09-08 දින බවත්,

- එම අයදුම් පත්‍රය 2017-09-14 දින පශ්චාත් උපාධි ආයතනය වෙත යොමු කර ඇති අතර, 2017-09-18 දින අයදුම්පත පශ්චාත් උපාධි ආයතනය වෙත ලැබී ඇති බවත් පැමිණිලිකාරිය විසින් ලබා දී ඇති වැඩිදුර සාක්ෂි අනුවද අනාවරණය වේ.

**නිරීක්ෂණය :-**

පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයේදී ඉහත අනාවරණය අනුව පැමිණිලිකාරිය වන වෛද්‍ය ශ්‍යාමලී මිය විසින් අදාල පශ්චාත් උපාධි පරීක්ෂණයට යොමු කර ඇති අයදුම්පත්‍රය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය වෙත නියමිත කාලය තුළ ලැබී නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකාරියගේ අතපසුවීමකින් තොරව සහ ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රමාදයකින් තොරව එම අයදුම්පත්‍රය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගෙන තිබූ තත්වය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල නිලධාරීන්ගේ නොසැලකිලිමත් ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලිකාරියගේ අදාල විභාගය සඳහා පෙනී සිටීමට අවශ්‍ය වන ප්‍රවේශ පත්‍රය ලැබී නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවෙකු ලෙස නම් කර ඇති ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ එම කාර්ය මණ්ඩලයේ ක්‍රියාකලාපය මත සිදුව ඇති පරිපාලන දෝෂ හේතුවෙන් පැමිණිලිකාරියට අගතියක් සිදුව ඇති බවට නිරීක්ෂණය වේ.

**නිගමනය =:**

ඒ අනුව පැමිණිලිකාරිය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඉහත පරිදි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් කඩවී ඇති බැවින්, පැමිණිල්ලේ විෂයගත කාරණය අනුව එම විභාගය දැනටමත් පවත්වා අවසාන වීමත්, ඇයට ඊට ඉදිරිපත් වීමටද අවස්ථාවක් නොලැබීමත් හේතුවෙන් එම තත්වයද සැලකිල්ලට ගෙන ඊට සම්බන්ධ සෞඛ්‍ය අමාත්‍යාංශයේ

නිලධාරිනිය පිළිබඳව විනය පරීක්ෂණයක් පවත්වා අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමට සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.12.[illegible] වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) ,
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
සෞඛ්‍ය අමාත්‍යංශය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
සුවසිරිපාය, කොළඹ 08.

02. සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යංශය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
සුවසිරිපාය, කොළඹ 08.

B/-